ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
අධ්‍යාපනවේදී ස්වභාවික විද්‍යා ගෞරව උපාධි වැඩසටහන-පස්වන මට්ටම - 2022/2023
අවසාන පරීක්ෂණය 2023
**STU5513 - තුලනාත්මක අධ්‍යාපනය හා අධ්‍යාපන ගැටලු**
කාලය පැය තුනයි. (03)

---

දිනය - 2023.11.24 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද , 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. තුලනාත්මක අධ්‍යාපනය යන සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න.

02. ඔබ ස්වභාවික විද්‍යා විෂය උගන්වන ගුරුවරයෙකු ලෙස තුලනාත්මක අධ්‍යාපනය විෂය හැදෑරීමෙන් ලැබෙන ප්‍රයෝජන තුනක් (03) විස්තර කරන්න.

03. ඇමරිකා එක්සත් ජනපදය බහු සංස්කෘතික අධ්‍යාපනය ලබාදීම සඳහා ගත් ප්‍රධාන අධ්‍යාපන ප්‍රවේශ තුනක් (03) නම් කරන්න.

04. රටක ජාතික මට්ටමේ භාෂා ප්‍රතිපත්තියක් සැකසීමේ ප්‍රයෝජන පහක් (05) දක්වන්න.

05. 1944 පිහිට වූ බට්ලර් පනත මගින් හඳුන්වා දුන් ත්‍රෛපාර්ශ්වික පාසල් ක්‍රම නම් කරන්න.

06. ස්කොලාකල් කොමිසමේ ප්‍රධාන කාර්යය දෙකක් (02) පැහැදිලි කරන්න.

07. 1960 දශකයේ දි ගුරු අධ්‍යාපනයේ සිදු වූ වෙනස්කම් පහක් (05) නම් කරන්න.

08. 1972 විෂයමාලා ප්‍රතිසංස්කරණය මගින් කණිෂ්ඨ ද්විතීයික විෂයමාලාවට හඳුන්වා දුන් වෙනස්කම් පහක් (05) දක්වන්න. (ලකුණු 05 x 08 = 40)

## 2 වන කොටස

09. (i) පැරණි ශ්‍රී ලංකාවේ ස්වදේශීය අධ්‍යාපන ක්‍රමයේ ප්‍රධාන කොටස් තුන (03) නම් කර, ඉන් එකක් (01) පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 04)

(ii) " මෙරට පෘතුගීසි අධ්‍යාපනයට වඩා ලන්දේසි අධ්‍යාපනය වඩා විධිමත් විය."
උදාහරණ දෙකක් (02) ඉදිරිපත් කරමින් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(iii) බ්‍රිතාන්‍ය පාලන සමය තුළ පිහිට වූ මෝර්ගන් කමිටුවේ නිර්දේශ ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය සඳහා වැදගත් වූ ආකාරය කරුණු හතරක් (04) ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 08)

10.(i) ජපානයේ මෙයිජි පාලන සමයේ අධ්‍යාපන ප්‍රතිසංස්කරණ තුළ දක්නට ලැබුණු සුවිශේෂී ලක්ෂණ හතරක් (04) නම් කරන්න. (ලකුණු 04)

(ii) ජපානයේ ප්‍රාථමික අධ්‍යාපනයේ දක්නට ලැබෙන ලක්ෂණ දෙකක් (02) මෙරට ප්‍රාථමික අධ්‍යාපනය සමඟ සසඳමින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) ජපානයේ උසස් අධ්‍යාපනය තුළ දක්නට ලැබෙන ප්‍රබලතා දෙකක් (02) නම් කර, ඒවා ශ්‍රී ලංකාවේ අධ්‍යාපනය තුළට යොදාගත හැකි ආකාරය විස්තර කරන්න. (ලකුණු 08)

11. (i) අධ්‍යාපනයේ අභ්‍යන්තර කාර්යක්ෂමතාව සහ බාහිර කාර්යක්ෂමතාව අතර ඇති වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ අභ්‍යන්තර කාර්යක්ෂමතාව දුර්වල වීමට බලපෑ හේතු හතරක් (04) විස්තර කරන්න. (ලකුණු 08)

(iii) ශ්‍රී ලංකාවේ අධ්‍යාපනයේ බාහිර කාර්යක්ෂමතාව දියුණු කිරීමට ක්‍රියාත්මක කළ හැකි උපක්‍රම හතරක් (04) යෝජනා කරන්න. (ලකුණු 08)

12. (i) "ගෝලීයකරණය" යන සංකල්පය පිළිබඳ ඔබේ නිර්වචනයක් ගොඩනඟන්න. (ලකුණු 04)

(ii) ගෝලීයකරණයේ ප්‍රතිඵල වශයෙන් උද්ගතව ඇති නව ප්‍රවණතා ස්වභාවික විද්‍යා විෂය ඉගැන්වීමේදී ඵලදායී ලෙස යොදාගත හැකි ආකාර හතරක් (04) විස්තර කරන්න. (ලකුණු 08)

(iii) ගෝලීයකරණය නිසා සංවර්ධනය වෙමින් පවතින රටවල අධ්‍යාපන පද්ධතිය මුහුණ දෙන ගැටලු දෙකක් (02) සාකච්ඡා කරන්න. (ලකුණු 08)

13.(i) ස්වභාවික විද්‍යා විෂය උගන්වන ගුරුවරයෙකු ලෙස ඔබේ විෂය ඉගැන්වීමේ දී ඔබ විසින් ප්‍රගුණ කරගත යුතු ගුරු භූමිකාවට අදාළ ලක්ෂණ හතරක් (04) දක්වන්න. (ලකුණු 04)

(ii) ස්වභාවික විද්‍යා විෂය උගන්වන ගුරුවරයෙකු ලෙස ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ ඔබ මුහුණ දෙන ගැටලු හතරක් (04) විස්තර කරන්න. (ලකුණු 08)

(iii) ඉහත ඔබ විසින් ඉදිරිපත් කළ ගැටලු විසඳීම සඳහා යෝජනා හතරක් (04) සාකච්ඡා කරන්න. (ලකුණු 08)

හිමිකම් ඇවිරිණි.